සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

1 "අදිති"

පැය 01 යි

විභාග අංකය .....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

පිටු අංකය	ලැබූ ලකුණු
1	
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය.	V/I/S/CH

01. පළමු රූපයත් දෙවන රූපයත් අතර වෙනස්කම් ගණන කීය ද ?






(1) 2 කි (2) 3 කි (3) 4 කි


- රූපයෙන් දැක්වෙන ක්‍රියාව හොඳින් අර්ථවත් වන වචනය තෝරන්න.

02.



(1) අනතුරුදායක (2) වෛරය (3) විනෝදය

03.



(1) දුවනවා (2) නානවා (3) උයනවා

04. නාමල් උයන ප්‍රාථමික විද්‍යාලයේ සියලු ම පිරිමි ළමයි දිවීමට දක්ෂ ය. සනුජ ද පිරිමි ළමයෙකි. එසේ නම් සනුජගේ දිවීම සම්බන්ධයෙන් කීමට හැක්කේ,

(1) දිවීමට දක්ෂය (2) දිවීමට අදක්ෂය (3) නිශ්චිතව කිව නොහැක

05. සිසුන් තිදෙනෙක් ගැහැනු, පිරිමි, මල්, පලතුරු, නගර ගම් ක්‍රීඩාවේ නිරත වූහ. ඒ අතරින් එක් වතාවක දී සපයා තිබූ පිළිතුරු පහත දැක්වේ. මෙහි නිවැරදි පිළිතුර තෝරන්න.

(1) නාමලී – සුනිල් – අරලිය – නාරං – කඩවත – අනුරාධපුර

(2) නන්දාවතී – නිමල් – නා මල – නමිනං – නාම්බාකඩ – නිට්ටඹුව

(3) නන්දනී – නිශාන්ත – නියඟලා – නෙල්ලි – නාඋල – කලත්තෑව

නම .....

06. නැගෙනහිර දිශාවට මුහුණලා සිටි දිනිති වරකට වට කාලක් බැගින් තුන් වතාවක් වාමාර්තව හැරී නතර වූවා ය. දැන් ඇයගේ වම් අත පැත්තේ ඇති දිශාව කුමක් ද ?

(1) දකුණ (2) නැගෙනහිර (3) උතුර

07. මට මිතුරන් පස්දෙනෙක් සිටිති. අපි සියලු දෙනාට ම එකිනෙකා අතර හුවමාරු කරගැනීමට අවශ්‍ය වෙසක් කාඩ්පත් ගණන කීය ද ?

(1) 20 (2) 15 (3) 30


08. කුඩා ගොවිපොළක කුකුළන් සහ ගවයින් 19 දෙනෙක් සිටිති. එහි සිටි ගවයින්ගේ පාද ගණන 24ක් නම් එහි සිටි කුකුළන්ගේ පාද ගණන කීය ද ?

(1) 13 (2) 26 (3) 36

09. සඳසිට වඩා නෙතුලි උස නමුත් නුවංගි තරම් නෙතුලි උස නැත. මෙතුලි නුවංගි තරම් උස නැතත් නෙතුලිට වඩා උස ය. ඔවුන්ගේ උසෙහි ආරෝහණ පිළිවෙළට නම් ලියා ඇති පිළිතුර තෝරන්න.


(1) සඳසි, නෙතුලි, නුවංගි, මෙතුලි
(2) සඳසි, මෙතුලි, නෙතුලි, නුවංගි
(3) සඳසි, නෙතුලි, මෙතුලි, නුවංගි

10. දරුවන් කිහිපදෙනෙක් කුඩා ඝනක යොදා ගෙන විශාල ඝනක නිර්මාණය කිරීමෙහි නිරත වූහ. එහිදී පළමු අවස්ථාවේ දී නිර්මාණය වූ ඝනකය පහත දැක්වේ. ඒ අනුව දෙවන සහ තුන්වන අවස්ථාවන්වල නිර්මාණය වූ විශාල ඝනකවල තිබුණු කුඩා ඝනක ගණන පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.



(1) 12, 24 (2) 27, 64 (3) 16, 32

11. එක් එක් වෘත්තය තුළ ඇති කුඩා ම ඉලක්කම් භාවිත කර සෑදිය හැකි විශාල ම සංඛ්‍යාව වන්නේ,




(1) 7321

(2) 8654

(3) 7651

- පහත රූපය පරීක්ෂාකර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




12. ත්‍රිකෝණයට පමණක් අයත් ඉලක්කම වන්නේ

(1) 7 (2) 4 (3) 2

- රටාව අනුව හිස්තැනට ආ යුතු පිළිතුර තෝරන්න

13.



(1) 7 (2) 4 (3) 2

14. මෙම රූපයේ සෘජුකෝණාස්‍ර කීයක් තිබේ ද ?



(1) 20 (2) 18 (3) 16

15. ජනවාරි මාසයේ 1 දා ඉරිදා දවසකි. ඒ අනුව ජනවාරි මාසයේ 26වන දා ට යෙදෙන දවස කුමක්ද?

(1) සෙනසුරාදා (2) අඟහරුවාදා (3) බ්‍රහස්පතින්දා

16. ළමයෙක් පිට්ටනියක හරි මැද සිට නැගෙනහිර දිශාවට මීටර 6 ක් ගොස් තම දකුණු අත පැත්තට හැරී තවත් මීටර 6 ක් ගොස් යළි තම දකුණු අත පැත්තට හැරී තවත් මීටර 6 ක් ගොස් නතර විය. දැන් ඔහු සිටින්නේ මුලින්ම සිටි ස්ථානයට කොපමණ දුරකින් ද?

(1) මීටර 18 (2) මීටර 6 (3) මීටර 8

- හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.

17. ගඟ : ඉවුර නම් වැව : .....

(1) සොරොව්ව (2) බැම්ම (3) පතුල

18. ටයරය : රබර් නම් බැලුම් බෝලය : .....

(1) ප්ලාස්ටික් (2) පොලිතීන් (3) රබර්

- කොටුවට ආදේශ කළ හැකි සංඛ්‍යා තෝරා යටින් ඉරක් අඳින්න.

19. [45] + 18 = 63

(1) 10 + 19 (2) 49 - 39 (3) 9 X 5

20. [4 x 3] - 9 = 3

(1) 12 − 6 (2) 36 ÷ 3 (3) 18 + 3

21. ඉරි ඇඳි පදය කිසියම් සිදුවීමකට හේතුවක් ලෙස දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) දැඩි නියඟය නිසා <u>වගාවන් විනාශ විය.</u>

(2) රාජා විභාගය අසමත් වූයේ <u>පාඩම් වැඩ නොකළ නිසා ය.</u>

(3) උත්සාහ කළොත් <u>ජය ලැබිය හැකි ය.</u>


22. ගිම්සරා ළඟ ඇති ටොෆි ගණනට 8 ක් වැඩියෙන් අභිලාෂ් ළඟ ටොෆි තිබේ. අභිලාෂ් ළඟ ඇති ටොෆි ගණන 24 ක් නම් ගිම්සරා ළඟ ඇති ටොෆි ගණන කීය ද?


(1) 18 කි (2) 16 කි (3) 32 කි


23. පෙට්ටියක රතුපාට වළලු මෙන් දෙ ගුණයකට වඩා 9 ක් වැඩියෙන් කහපාට වළලු තිබේ. පෙට්ටියේ ඇති මුළු වළලු ගණන 45 ක් නම් රතුපාට වළලු ගණන සොයන්න.


(1) 12 කි (2) 15 කි (3) 14 කි


• පහත ප්‍රශ්නවල පළමු රූපයෙන් දැක්වෙන්නේ සමචතුරස්‍රාකාර කඩදාසියක් හතරට නවා එහි එක් පැත්තක කොටසක් කතුරෙන් කපා ඉවත් කර ඇති ආකාරයයි. එය දිග හැරිය විට පෙනෙන අකාරය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.


24. 



(1)



(2)


(3)

25. 


(1)


(2)


(3)

26. ප්‍රහේලිකාව තුළ සඟවා ඇති වචනය වන්නේ,

මුල අකුර කතරේ ඇත - හතරේ නැත

දෙවන අකුර අතලේ නැත - බතලේ ඇත


තුන්වන අකුර ලණුවේ ඇත - කණුවේ නැත


(1) අතර (2) අබල (3) කබල

27. පාසලක 3 ශ්‍රේණියේ සිටින සිසුන් සංඛ්‍යාව 36 කි. එයින් $\frac{2}{3}$ ක් පිරිමි ළමයින් ය. එහි සිටින ගැහැනු ළමයි සංඛ්‍යාව කොපමණ ද?

(1) 12 (2) 24 (3) 18

● කොටුවක ඇති ද්‍රව්‍යවල මිල ඊට ඉදිරියෙන් දක්වා ඇත. සමාන ද්‍රව්‍යවල මිල එකමය. එය බලා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





28. ගස්ලබු ගෙඩියක මිල කීය ද?

(1) රු. 45 . 00 (2) රු. 75 . 00 (3) රු. 60 . 00

29. අන්නාසි ගෙඩියක මිල කීය ද?

(1) රු. 75 . 00 (2) රු. 65 . 00 (3) රු. 85 . 00

30. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) 78 + 17 + 141 + 395 = 632

(2) 306 + 267 + 20 + 216 = 809

(3) 104 + 57 + 344 + 77 = 583

31. B + D = 9


B – D = 5 නම්,

B හි අගය කීය ද ? (1) 5 (2) 7 (3) 6

32. B × D = ...

(1) 11 (2) 12 (3) 14



- සංකේතවලට වචන ආදේශ කර ඇති ආකාරය පහත දැක්වේ.ඒ අනුව වාක්‍යවලට ගැළපෙන සංකේත තෝරන්න.



33. බල්ලා පාරට එනවා.

(1)  (2)  (3) 


34. අම්මා නිවසට යනවා.

(1)  (2)  (3) 

35. කොන්ක්‍රීට් මිශ්‍රණයක් සාදා තිබුණේ සිමෙන්ති, වැලි, ගල් 1:2:3 අනුපාතයට ය. එම කොන්ක්‍රීට් මිශ්‍රණයේ මුළු තාච්චි ගණන 48ක් නම් එයට යොදා ඇති වැලි තාච්චි ගණන කීය ද ?

(1) 8 (2) 16 (3) 24

36. පහත රූපයේ ප්ලාස්ටික් යොදා සෑදූ උපකරණ කීයක් දැක්වේ ද ?



(1) 23 (2) 18 (3) 34

37. සමචතුරස්‍රයක එක් පාදයක දිග 5cmකි. එවැනි ම සමචතුරස්‍ර 4ක් එකිනෙක යා කරමින් සාදා ගත් සෘජුකෝණාස්‍රයක වටේ දිග කොපමණ ද ?

(1) 50cm (2) 40cm (3) 55cm

38. මුහුණ බලන කණ්ණාඩියකින් බලන විට වෙනස් නොවී පවතින අකුරු කට්ටලය තෝරන්න.

(1) CHZA (2) UHNX (3) HUMV

39. ත්‍රිකෝණාකාර රටාවක් ලැබෙන පරිදි සබන් කැට අසුරා තිබුණි. එහි යට ම පේළියේ සබන් කැට 10ක් තිබුණේ නම් එහි තිබුණු මුළු සබන් කැට ගණන කීය ද ?

(1) 49 (2) 55 (3) 50

40. මවුවරුන් දෙදෙනෙකු සහ දියණියන් දෙදෙනෙකු බංකුවක වාඩිවී සිටි අතර තිදෙනාම තේ පානය කරමින් සිටියෝ ය. මෙම ප්‍රකාශය ඇසුරෙන් නිශ්චිතව කිව හැකි දේ තෝරන්න.

(1) සත්‍ය වේ (2) අසත්‍ය වේ (3) කිව නොහැක

සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

පාසල්වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

"අදිති"

පෙරහුරු විභාගය - 01

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය .....

විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 57 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

පිටු අංකය	ලැබූ ලකුණු
1	
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණ	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදිය.	V/I/S/CH

01. පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ඡේදය ඇසුරින් සපයන්න.

කළුවා ගොවිපළ හරහා තරග තුරඟකු සේ වේගයෙන් දිව ගොස් වැටෙන් පැන ගන්නට වෑයම් කළේ ය. ඔහු වැටට නගිද්දී ම පිටුපසින් ආ පොලිස් භටයෙක් ඔහු කකුලකින් අල්ලා ඇද බිම හෙළී ය. කළුවා වැටී සිටිය ද ඔහු දමනය කර ගැනීමට පහසු නොවී ය. වියරු වූ මෘගයෙකු මෙන් හැසුරුණු ඔහු පොලිස් භටයාගේ අත හපන්නට තැත් කළේ ය. පොලිස් භටයා ඔහුගේ අනෙක් භටයාගේ සහය ද ඇති ව ඔහු ව අභිභවා ඔහුට මාංචු ලා ඔහු ගෙය දෙසට ඇදගෙන ආවේ ය.

(i) වැටෙන් පැන යන්නට උත්සාහ කළේ කවු ද ?

.....

(ii) මෙම අවස්ථාවට සම්බන්ධ අනෙක් අය කවුරුන් ද ?

.....

(iii) " **දමාගෙන** " යන අදහස දීමට ඡේදයේ යෙදී ඇති පදය කුමක් ද ?

.....

(iv) මෙම කතාවෙහි වරදකරු ගෙන යාමට පෙර අවසානයේ කළේ කුමක් ද?

.....

(v) බිම වැටී සිටි වරදකරුගේ හැසිරීම සමාන කර ඇත්තේ කාට ද ?

.....

(vi) මහප්‍රාණ අකුරක් සහිත වචනයක් තෝරා ලියන්න

.....

02. පහත සඳහන් වැකි ලියා ඇති ආකාරය හරි නම් √ ලකුණ ද වැරදි නම් × ලකුණ ද වරහන් තුළ යොදන්න.

(i) අපි පාසල් ගියෙමු. (.....)

(ii) කුරුල්ලන්ගේ හඬ අපට ඇසුණේ ය. (.....)

(iii) වලාකුළු අහසේ පා වුණෝ ය. (.....)

03. අක්ෂර වින්‍යාසය වැරදි වචන පමණක් නිවැරදි කර පහත හිස්තැනෙහි ලියන්න.

(i) ප්‍රදේෂයම යට කරමින් මහ වර්ශාවක් ඇද වැටුණි.

....

(ii) පුස්ථකාලයෙන් එළියට ආ අපි කිය වූ පොත් ගැන සාකච්චා කළෙමු.

....

04. පහත සඳහන් පදවලට සමාන පද ලියන්න

(i) හිස = ... (ii) ග්‍රන්ථය = ... (1x13 = 13)

05. පහත සඳහන් වැකිවල අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අනුන් රවටන්නට ගොස් තමා ම රැවටීම

.....

(ii) විමසීමකින් තොර ව යමක් කිරීම -

.....

(ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ / කළුවා මාරපන් ගියා වගේ / ආඬි හත්දෙනාගේ කැඳ හැළිය වගේ)

06. පහත දැක්වෙන වාක්‍ය ඒකවචන අතීතකාල වාක්‍ය බවට හරවා ලියන්න.

(i) වලාකුළ අහසේ පාවෙයි. .....

(ii) ඇය පාරේ ගමන් කරයි .....

07. පහත සඳහන් එක් එක් වගන්තිය සඳහා ගැළපෙන පදය වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

(ගොවියා / ගොනා / නිවස / සරුංගලය)

(i) ස්ථාන නාම පදයකි. .....

(ii) ද්‍රව්‍ය නාම පදයකි. .....

(iii) සත්ත්ව නාම පදයකි. .....

08. පහත රූප සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන වචන ඉංග්‍රීසි අකුරින් ලියන්න.



K | | | | |



H | | | | |

09. පහත සඳහන් වාක්‍ය ඉංග්‍රීසියෙන් කියවෙන ආකාරය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.

මට ගීතයක් ගයන්න ඕනෑ : .....

10. පහත සඳහන් වචනවල සිංහල තේරුම සිංහල අකුරින් ලින්න.

(i) Sister - ..... (ii) Farmer - .....

11. පහත වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

(i) play / can / cricket / I .....

(ii) a / There / well / is .....

12. පහත වාක්‍යය දෙමළෙන් ලියන ආකාරය සිංහල අකුරින් ලියන්න.

මම ආච්චී : .....

13. පහත වාක්‍යයෙහි සිංහල තේරුම ලියන්න.


මුහම් කළුවුංගල් :- ..... (1 x 16 = 16)

- **අංක 14 සිට 29 තෙක් දී ඇති හිස්තැන් මත පිළිතුරු සපයන්න.**

14. 7077 ට පෙර සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.


.....

15. රවුම තුළ ඇති ඉලක්කම්වලින් 5 න් නිරූපිත අගය 500 ද 3න් නිරූපිත අගය 3 ද වන ඉලක්කම් හතර ම යොදාගෙන සෑදිය හැකි සංඛ්‍යාව ලියන්න.



.....

16. පහත ඇති අඹ ගෙඩි සංඛ්‍යාව රෝම සංඛ්‍යාවෙන් ලියන්න.



.....

17. සංඛ්‍යා යෙදී ඇති රටාව අනුව හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

25 , 30 , 40 , 55 .....

18. එක ගොඩක ජම්බු ගෙඩි 240ක් තිබුණි. එයට තවත් ගෙඩි 68ක් දමා ඒවා සමාන ව ගොඩකට හතර බැගින් වෙන් කරන ලදී. පසුව එක ගොඩක් රු. 10.00 බැගින් විකුණන ලදී.

(i) විකුණූ රඹුටන් ගණන කීයද ? .....

(ii) රඹුටන් විකිණීමෙන් උපයා ගත් මුදල කීයද ? රුපියල් .....


19. මිනිසෙකුට කැපීමට ඇති කාණුවක දිග 75m කි. එයින් මීටර 30 සෙන්ටිමීටර 75 ක් කපන ලදී . කැපීමට ඇති ඉතිරි කාණුවේ දිග කීයද ?

..... m ..... cm

20. තාත්තා පෙරවරු 2 .30ට බසයට නැග පැය 2 මිනිත්තු 10ට පසු බසයෙන් බැස්සේ ය තාත්තා බසයෙන් බැස ගිය වේලාව ලියන්න.

පෙරවරු .....

21. දී ඇති පැන්සලේ දිග සොයන්න.



a ..... cm

22. පහත බිල්පතෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍යය	එකක මිල(රුපියල්)	ඒකක ගණන	මුදල
පෑන්	35	3	.....
චතුර බෝතලය	350	.....	700
		එකතුව	805

(2 x 9 =18)

23. නගර දෙකක් අතර දුර 18km කි. එයින් 15km 850m ක් ගමන් කළේ බසයෙනි. ඉතිරිය ත්‍රීරෝද රථයකින් ගියේ නම් ත්‍රීරෝද රථයෙන් ගිය දුර කොපමණ ද ?

..... km ..... m

24. නාරං ගෙඩි 24 කින් හතරෙන් පංගු තුනක් $\frac{3}{4}$ ක් යනු නාරං ගෙඩි කීය ද?

.....


25. මල්ලක විකිණීමට තිබූ හාල්වල බර 16 kg ක් වේ. එයින් 12 kg 750g ක් විකුණන ලදී. තවත් විකිණීමට ඉතිරි ව ඇති හාල්වල බර සොයන්න.

..... kg ..... g

26. බඳුනකට ජලය ලීටර 15 ක් පිරවිය හැකි යි. දැනට ජලය ලීටර 10 මිලිලීටර 325ක ප්‍රමාණයක් පුරවා ඇත්නම් තව දැමිය හැකි ජල ප්‍රමාණය කෙතෙක් ද?

..... l ..... ml

27. රූපයේ පාට කළ කොටසෙහි අගය භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.



.....


28. විරුද්ධ මුහුණත් පමණක් එකිනෙකට සමාන වූ ඝන වස්තුවෙහි නම කුමක් ද?

.....

29. (i) ප්‍රස්තාරයේ දැක්වෙන තොරතුරු අනුව වගුවෙහි හිස්තැන පුරවන්න.

(ii) වගුවෙහි දැක්වෙන තොරතුරු අනුව ප්‍රස්තාරය සම්පූර්ණ කරන්න.

එළවළු වර්ගය	බර kg
බටු	6
බීට්	8
මිරිස්	10
ගෝවා	.....



(2 x 7 =14)

• **අංක 30 සිට 60 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.**

30. සූර්ය නමස්කාර අභ්‍යාසයේ හතරවන අවස්ථාව තෝරන්න.



(1)



(2)



(3)

31. ශාකවලට හානි කරන සතුන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) කැරපොත්තා , ගෙමැස්සා (2) පුරුක් පණුවා , පිටි මකුණා

(3) මකුණා , උකුණා

32. නිවසක් තුලට ස්වාභාවික සිසිල් සුළං ලබා ගැනීමට භාවිතා කරනු ලබන ක්‍රමයක් නොවන්නේ

(1) නිවෙස්වලට ජනෙල් සවි කිරීම (2) විදුලි පංකා භාවිතා කිරීමය

(3) බිත්තියේ ඉහළින් වා කවුළු තැබීම ය

33. ජාතික ගීය ගයන අවස්ථාවේ පිළිපැදිය යුතු දෙයකි,

(1) පාද දෙක ඇතින් තිබීම (2) අවසානයේ හිස මදක් පහත් කිරීම

(3) දෑස් පියාගෙන සිටීම

34. මුස්ලිම් ජන වර්ගයාගේ අනන්‍යතාව සහතික කරන ඇඳුමේ කොටසක් **නොවන්නේ**

(1) හබායා (2) ඉජාහාප් (3) ඉන්දියානු සාරිය

35. පෞද්ගලික ව පරිහරණය කරන දෙයක් වන්නේ

(1) රූපවාහිනිය 2. තුවාය (3) පුටුව

36. ශාකපත්‍ර කහ පැහැය ගැනීමට බල පෑ හැකි හේතුවක් වන්නේ,

(1) ජලය නොලැබීම (2) හිරු එළිය නොලැබීම (3) වාතය නොලැබීම

37. ඇස මඟින් පමණක් තොරතුරු ලබා දෙන මාධ්‍ය වන්නේ,

(1) රූපවාහිනිය (2) ශබ්දවිකාශන යන්ත්‍රය (3) පුවත්පත

38. ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම කර වූ වැව වන්නේ,

(1) තිසා වැව (2) අභය වැව (3) පරාක්‍රම සමුද්‍රය

39. ගෙවත්තක බෝග වගාකිරීමේදී භාවිත කරන උපකරණයක් **නොවන්නේ,**

(1) උදැල්ල (2) කියත (3) රේක්කය

40.  මෙම සතාගෙන් බෝ විය හැකි රෝගයකි.

(1) බරවා (2) පාචනය (3) කොළරාව

41. පාර හරහා මාරු වීමේ නිවැරදි ක්‍රමවේදය තෝරන්න.


(1) පළමුව වම බලා දෙවනුව දකුණු බලා පාර මාරු වන්න.

(2) පළමුව දකුණ බලා දෙවනුව වම බලා පාර මාරු වන්න.

(3) පළමුව දකුණ බලා දෙවනුව වම බලා නැවත දකුණු බලා පාර මාරු වන්න.

42. මෙම උපකරණය යොදා ගන්නේ

(1) පතල් කර්මාන්තයේ දී (2) ධීවර කර්මාන්තයේ දී



(3) වඩු කර්මාන්තයේ දී

43. බරවා රෝගය පැතිරෙන්නේ

(1) මැස්සා මඟින් (2) ඇනෝෆිලිස් මදුරුවා මඟින්

(3) කියුලෙක්ස් මදුරුවා මඟින්

44. ගලගණ්ඩය රෝගය ඇති වනුයේ පහත කුමක් හිඟ වීමෙන් ද?

(1) කැල්සියම් (2) අයඩීන් (3) යකඩ

45. පහත දැක්වෙන සත්ත්වයින් අතරින් ගෘහාශ්‍රිත සතෙකි

(1) කුකුළා (2) වඳුරා (3) වළහා

46. මාළුවා ආස්වාස, ප්‍රාස්වාස කරනු ලබන්නේ

(1) පෙනහලු මඟින් (2) කරමල මඟින්

(3) වරල් මඟින්


47. මේ අතුරින් පොද්ගලික ආයතනයක් වන්නේ

(1) ප්‍රාදේශිය සභාව (2) තැපැල් කාර්යාලය (3) සුපිරි වෙළඳසැල

48.  පුරාණයේ ගෙවල්වල සාදා තිබූ මෙහි, ගබඩා කරන ලද දේ කුමක් ද?

(1) රෙදි (2) වී (3) පිඟන් බඳුන්


49. මෙම සලකුණ බොහෝ විට ඇත්තේ,



(1) වෛද්‍ය මධ්‍යස්ථානයක ය.

(2) පාසලක ය.

(3) පොදු වෙළෙඳ මධ්‍යස්ථානයක ය.

50.  රූපයේ දැක්වෙන උපකරණය භාවිත කරන ලද්දේ,

(1) මිරිස් ඇඹරීමට ය.

(2) ධාන්‍ය වර්ග ඇඹරීමට ය.


(3) තෙල් සිඳීමට ය.

51. අධිවේගී මාර්ගවල ගමන් කිරීමට නුසුදුසු අනාරක්ෂිත වාහනය මින් කුමක් ද?

(1) බසය (2) වෑන් රථය (3) යතුරු පැදිය

52. " තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා " මෙම කවිය,

(1) පැල් කවියකි. (2) පතල් කවියකි. (3) කරත්ත කවියකි.

53.  මෙම උපකරණ හඳුන්වන නම් ලියන්න.

(1) මට්ටම් ලෑල්ල (2) රේක්කය (3) ගොවි පෝරුව

54. ප්‍රෝටීන් අඩංගු ආහාරයක් **වන්නේ**,

(1) කොස් (2) බිත්තර. (3) දෙල්.

55. පහත ඒවායින් ජලය රත් කර ගැනීම සඳහා යොදාගත හැක්කේ,

(1) ගිල්ලුම් තාපකය (2) ස්ත්‍රික්කය (3) හැඹිලිය

56. දැති රෝදය භාවිත වන උපකරණයක් වන්නේ

(1) විල්බැරෝව (2) ගොන් කරත්තය (3) ඔරලෝසුව


57. මල්වල පැණි බීමට නොපැමිණෙන සතෙකි,

(1) සමනලයා (2)පැණි කුරුල්ලා (3)දෙබරා

58. පහත දී ඇති බීජ අතරින් ඉක්මනින් ම පැළ නොවෙන බීජ වර්ගය කුමක් ද?

(1) අඹ (2) අබ (3) මුං

59. දණ්ඩ චුම්බකයකට ඇල්පෙනෙති ආකර්ෂණය වී ඇති ආකාරයක් රූපයේ දැකිවේ මෙය පිළිබඳ ඔබේ අදහස වන්නේ



(1) වැරදි ය (2) නිවැරදි ය (3) කිව නොහැකි ය

60. සුළං බලය යොදා නොගන්නා අවස්ථාවක් වන්නේ,

(1) සුළං දිශා දර්ශකය (2) දිය හොල්මන (3) වී සුළං කිරීමට

(1 x 30 = 30)

61. **සුන්දර දිය ඇල්ලක්** යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයකුම වචන පහකට වඩා වැඩි විය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධතාවය සහ අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය)

1. .....

.....

2. .....

.....

3. .....

.....

(පිරිසිදුබාවයට ලකුණු දෙකක් ලබා දෙන්න)